**සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**මහනුවර**
*******

**<u>මාධ්‍ය නිවේදනය</u>**

**9 වන ජාත්‍යන්තර යෝගා දිනය සැමරීම (IDY),2023**

සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ,මහනුවර, දේශීය ජනතාවගේ උද්යෝගීමත් සහභාගීත්වයෙන් 9 වැනි ජාත්‍යන්තර යෝග දිනය සමරන ලදී.

2. 2023 ජාත්‍යන්තර යෝගා දිනයේ ප්‍රධාන උත්සවය මහනුවර සහස් උයනේදී ජුනි 21 වැනි දින පෙ.ව.08.00 ට පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර ගරු ලලිත් යූ.ගමගේ මහතා සහභාගී විය. ගරු ආණ්ඩුකාරතුමා සිය කතාවේදී මානසික ආතතිය මැඩපැවත්මෙහිලා යෝගා ක්‍රියාකාරකම් වල වැදගත්කම සහ එහි ඇදහිය නොහැකි ප්‍රතිලාභ පිළිබදව සදහන් කළේය . විනාඩි 30 ක යෝගා සැසියෙන් අනතුරුව මහනුවර බ්‍රහ්ම කුමාරි රාජයෝග මධ්‍යස්ථානය විසින් භාවනා සැසියක්ද පවත්වන ලදී. මෙම අවස්ථාවට මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් අජිත් ප්‍රේමසිංහ මහතා, දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන් මහතා, වයඹ පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් එම්.ඒ.පී. සුදර්ශිනී මහත්මිය, පල්ලෙකැලේ යුද හමුදා කඳවුරේ වැඩබලන අණ දෙන නිළධාරී බ්‍රිගේඩියර් වසන්ත බණ්ඩාර මහතා, මහනුවර දිස්ත්‍රික් නියෝජ්‍ය පොලිස්පති මහින්ද දිසානායක, නාගරික කොමසාරිස් ඉෂාන් විජේතිලක සහ රජයේ විවිධ දෙපාර්තමේන්තු නියෝජනය කරමින් රාජ්‍ය නිළදාරීහු මෙම අවස්ථාවට සහභාගී වූහ.

3. 2023 ජාත්‍යන්තර යෝගා දිනයට සහභාගී වූ යෝගා ලෝලීන් වෙනුවෙන් වාසනාවන්ත දිනුම් ඇදීම්,කාර්යලයේ අභ්‍යන්තර යෝගා තරඟවල ජයග්‍රාහකයින් සඳහා සහ යෝගා උපදේශකවරුන් හා උපදේකවරියන් සඳහා උත්සවය අතරතුරදී ත්‍යාග සහ උපහාර පිරි නමන ලදී. මෙම අවස්ථාවට මධ්‍යම පළාතේ සහ ඒ අවට ප්‍රදේශවලින් යෝගා ලෝලීන් 300 ක් පමණ සහභාගී වූහ. සහකාර ඉන්දියානු මහ කොමසාරිස් වෛද්‍ය අතිරා එස්. මෙනෙවිය, සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය, සිසුන්, ගුරුවරුන්, රජයේ නිලධාරීන්, පොලිස් සහ හමුදා නිලධාරීන්, ඉන්දියානු ප්‍රජාවේ සාමාජිකයින් සහ මාධ්‍ය සහෝදරයින් සහ යෝගා ලෝලීන් මෙම අවස්ථාවට සහභාගී වූහ.

4. 2023 ජාත්‍යන්තර යෝගා දිනයට පෙර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යලය විසින් 2023 ජාත් යන්තර යෝගා දින සැමරුම් සනිටුහන් කිරීම සඳහා ජූනි 01 වැනි දින සිට දිස්ත්‍රික්ක හතක් පුරා යෝගා සැමරුම් එකොළහක් සංවිධානය කරන ලදී.

* * *
මහනුවර
2023.06.22